## ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල - 2017

-----------------------------------------------------------------

ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනතේ (432 අධිකාරියේ) 5 සහ 9 වගන්ති ප්‍රකාර පනවන ලද රෙගුලාසිවල 6 (1) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

------------------------

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

### 1.4 මතය ව්‍යාවනය සඳහා පදනම

-------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස ශේෂ පත්‍රයේ සහ ආදායම් වියදම් ගිණුමේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

## 2. මූල්‍ය ප්‍රකාශන

--------------------

### 2.1 මතය ව්‍යාවනය

--------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

---------------------------------------------

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

වයඹ, දකුණ, නැගෙනහිර, උතුරු මැද, ඌව හා උතුර යන පළාත්වලට අදාල දායක මුදල් අරමුදලට බැර වී නොතිබූ අතර ඒවා ලැබිය යුතු දායක මුදල් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කර නොතිබුණි.

**2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ වත්කම් යටතේ භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ ශේෂය ලෙස රු.768,159,240 ක් දක්වා තිබුණද එම වටිනාකම තහවුරු කිරීම සඳහා ශේෂ සනාථන විගණනය වෙත ඉදිරිපත් නොවීය.

(ආ) පිරිවෙන් හා පෞද්ගලික / උපකෘත පාසැල්වල ගුරුවරුන්ගෙන් වැන්දඹු /වැන්දඹු පුරුෂ හා අනත්දරු දායක මුදල් ලෙස සියයට 6 ක්ද ඔවුන් රාජ්‍ය නිලධාරීන් ලෙස පූර්ණ වශයෙන් පිළි නොගන්නා බැවින් ඔවුන්ගේ විශ්‍රාම වැටුප වෙනුවෙන් දායක මුදල් ලෙස සියයට 6 ක්ද වශයෙන් අරමුණු 2 ක් වෙනුවෙන් දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වෙත ලැබිය යුතු වේ. එසේ වුවද අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් මාසික ගිණුම් සාරාංශ යටතේ බැර නිවේදන මඟින් 2017 වර්ෂයේදී 8186 දරන ගිණුමට පළාත් 3 කින් පමණක් බැර කරන ලද රු.64,801,067 ක් වූ මුදල කුමන දායකත්වය සඳහා බැර කරන ලද්දේ ද යන්න නිශ්චිතව හඳුනාගත නොහැකි විය.

**2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.**

1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත අනුව පනවන ලද නියෝග අංක 9 (අ) නියෝගය ප්‍රකාරව එක් එක් ආධාර මුදල් ගෙවන්නන් පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛනයක් පවත්වා නොතිබුණි.

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු.131,957,353 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.102,956,197 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.29,001,156 ක වර්ධනයක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම රු.13,220,729 කින් හා දායක මුදල් ලැබීම් රු. 20,102,114 කින් ඉහළ යාම, ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනයට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

1953 අංක 44 දරන පාඨශාලීය ගුරුවරුන්ගේ විශ්‍රාම වැටුප් පනත් නියෝග අංක 04 ප්‍රකාරව ගුරු වැන්දඹු අනත්දරු දායක මුදල් මඟින් අරමුදලක් ගොඩනගා එමඟින් ගුරු වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් ගෙවීම් කළ යුතුය. එසේ වුවත් දායක මුදල් රැස් කිරීම හා වියදම් දැරීම සඳහා අරමුදල වෙනුවෙන් බැංකු ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබූ අතර දායක මුදල් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ වැන්දඹු අනත්දරු දායක මුදල් බැංකු ගිණුමට (අංක 100199026658) රැස්කර තිබීමත් විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තු වැය ශීර්ෂය යටතේ අයවැය ප්‍රතිපාදන මඟින් උක්ත වියදම් දැරීමත් හේතුවෙන් මෙම අරමුදල පිහිටුවීමේ අරමුණු ඉටු වී නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදලේ සාමාජික සංඛ්‍යාව, සමාලෝචිත වර්ෂය තුළ නව සාමාජිකත්වය ලබාගත් සංඛ්‍යාව, අරමුදලේ සාමාජිකත්වයෙන් ඉවත් වූ සංඛ්‍යාව සහ සාමාජිකයින්ගේ නම, පාසල ඇතුලත් උපලේඛනයන් නඩත්තු නොකිරීම නිසා අරමුදලට ලැබිය යුතු මුදල, ලද මුදල හා හිඟ මුදල් පිළිබඳ තොරතුරු විගණනයට අනාවරණය කර ගැනීමට නොහැකි විය.

(ආ) 2008 ජනවාරි 30 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ 3/2008 අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් සඳහා දායක මුදල් අයකල යුත්තේ මූලික වැටුපෙන් ප්‍රාථමික හා ද්විතියීක මට්ටම් සඳහා සියයට 6 ක් විය. එහෙත් පුද්ගලික පාසලක් වූ ශ්‍රී චන්ද්‍රානන්ද බෞද්ධ විද්‍යාලයේ ස්ථිර විශ්‍රාම වැටුප් සහිත ගුරුවරුන්ගෙන් වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් දායකය ලෙස රු. 776,380 ක් ලැබිය යුතු වුවත් මූලික වැටුපෙන් සියයට 2 ක් ලෙස රු. 258,793 ක් පමණක් ලැබී තිබුණි. ඒ අනුව දායක මුදල් රු. 517,587 ක් අඩුවෙන් ලැබී තිබුණි.

(ඇ) දායක මුදල් ආපසු ගෙවීමේදී දායකයාගෙන් අයකරගත් මුදල් ප්‍රමාණය චර්යා සටහන පරීක්ෂා කර ගෙවීමට කටයුතු කර තිබුණද, එම මුදල් නිවැරදිව අරමුදල සඳහා ලැබුණේද යන්න පරීක්ෂා කිරීමට ක්‍රමවේදයක් ස්ථාපිත කර නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

### 5.1 අභ්‍යන්තර විගණනය

මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී අරමුදලේ කටයුතු පිළිබඳව විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය මගින් හෝ අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳ වරින් වර විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | (i) අරමුදලේ ක්‍රියාකාරීත්වය පිළිබිඹු වන පරිදි ආදායම් හා වියදම් ගිණුම්ගත කර නොතිබීම.<br>(ii) සාමාජිකයන්ගේ කේවල ගිණුම් පවත්වා නොගැනීම. |
| (ආ) | දායක මුදල් කළමනාකරණය | ගුරු විශ්‍රාම අරමුදලට අදාල දායක මුදල් හා ගුරු වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලේ දායක මුදල් වෙන් වෙන්ව හඳුනාගනිමින් මෙම අරමුදලට අදාල දායක මුදල් ගිණුම්ගත කර නොතිබීම. |